**ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 21 දින නාවික හමුදාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 58,043 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 57,043 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,000 ක් හෙවත් සියයට 1.72 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 48,188 | 48,026 | 162 | 0.34 |
| මූලධන | 9,855 | 9,017 | 838 | 8.50 |
| **එකතුව** | **58,043** | **57,043** | **1,000** | **1.72** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 03 ක් හා දෙපාර්තමේන්තු 03 ක් විසින් එකතුව රු.මිලියන 1,877.12 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 514.12 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,363 ක් හෙවත් සියයට 72.61 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන සලසා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන | උපයෝජන | ඉතිරිය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආරක්ෂක අමාත්‍යාංශය | 474.00 | 456.00 | 18.00 |
| ප්‍රවාහන අමාත්‍යාංශය | 9.00 | 9.00 | - |
| මුදල් අමාත්‍යාංශය | 92.00 | 31.00 | 61.00 |
| ජනාධිපති කාර්යාලය | 72.00 | 18.00 | 54.00 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 1,230.00 | - | 1,230.00 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 0.12 | 0.12 | - |
| **එකතුව** | **1,877.12** | **514.12** | **1,363.00** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ විෂය අංක 22301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම - උපරිම සීමාව | වියදම - තථ්‍ය | ලැබීම් - අවම සීමාව | ලැබීම් - තථ්‍ය | හර ශේෂය - උපරිම සීමාව | හර ශේෂය - තථ්‍ය |
|---|---|---|---|---|---|
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 640.00 | 533.08 | 480.00 | 624.54 | 900.00 | 342.81 |

**2.2.2 ගබඩා අත්තිකාරම් ගිණුම**

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ විෂය අංක 22302 යටතේ ගබඩා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු. මිලියන |
| 345.00 | 343.91 | 360.00 | 509.95 | 350.00 | 150.11 |

**2.3 අග්‍රිම ගිණුම**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනට ගිණුම් අංක 7002/0000/00/0029/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 58 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0015/0104/000 දරන තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 289 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණ**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| | ------------------ | --------------------- |
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (iii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iv) | ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

**3.2 විසර්ජන ගිණුම**

**--------------**

**3.2.1 අයවැය විචලනය**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම නිකුත් කිරීම සීමා කිරීම හා හමුදාව විසින් සැපයුම්කරුවන් වෙත නිකුත් කර තිබුණු ඇණවුම්වලට අදාළ භාණ්ඩ හා සේවා සමාලෝචිත වර්ෂයේදී නොලැබීම නිසා වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 18 ක සිට සියයට 97 දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) මූලධන වැය විෂයයක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව පවසා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් බලපත්‍රයකින් රු.10,000,000 ක් වූ ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. වර්ෂය අවසාන වන විට අදාල කාර්ය ඉටු නොකිරීම නිසා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා වැය විෂයයන් 05 කට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.97,500,035 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිමවී දින 30 ක සිට දින 90 ක් දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ආ) යම් කාර්යයක් සඳහා අතුරු අග්‍රිම අවශ්‍යා ප්‍රමාණයට වැඩියෙන් ලබා ගැනිම සහ එම ලබාගත් අග්‍රිම භාවිතා නොකර අතරඳවාගෙන සිට දීර්ඝ කාල පමාවකට පසු එම තත්කාර්ය අතුරු අග්‍රිම පියවා තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.3,232,175 ක් වූ තැන්පතු 45 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.9,669,257 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ලබාදුන් විශේෂ අත්තිකාරම් ණය වාරික සහ ණය පොලී අයකර ගැනීම සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3.6 ගබඩා අත්තිකාරම් ගිණුම

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ගබඩා අත්තිකාරම් ගිණුමක කටයුතු ඉටුකර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම ගිණුම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ණයවර ලිපි ගිණුමේ ශේෂය රු.7,053,510 හා උපචිත ණයවර ලිපි ගිණුමේ ශේෂය රු.6,896,612 ක් වූයෙන් රු.156,898 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර අදාල වෙනසට හේතුව කුමක්ද යන්න පැහැදිලි නොකෙරුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් ගිණුමේ (පුපුරණ ද්‍රව්‍ය) ආදායම් ගිණුමට අනුව ආදායම රු.107,010,874 ක් වූ අතර ගබඩා අත්තිකාරම් ගිණුමේ ශුද්ධ ආදායම රු.108,673,320 ක් වූයෙන් රු.1,662,446 ක වෙනස කුමක්ද යන්න විගණනයට පැහැදිලි නොකෙරුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2015 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පිළියෙල කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මක තිබිය යුතු මූලික අවශ්‍යතාවයන් වන කාර්යය ඉටුකිරීම සඳහා වගකිව යුතු නිලධාරීන් සහ වාර්ෂික අයවැය ප්‍රතිපාදන එක් එක් කාර්යයන් අතර උපයෝජනය කරන ආකාරය එහි අන්තර්ගත වී නොතිබුණි. එසේම ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීමේ ප්‍රගතිය දැක්වෙන ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

### 3.7.2 ප්‍රසම්පාදන සැලැස්ම

2015 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබූ බැවින් එය ක්‍රියාත්මක සැලැස්මක් වශයෙන් යොදාගෙන නොතිබුණි

**3.7.3 විගණන හා කළමනාකරණ කමිටුව**

**-----------------------------------**

2009 ජූනි 09 දිනැති අංක DMA/09/01 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර කාර්තුවකට එක බැගින් රැස්වීම් පැවැත්විය යුතු වුවද, 2015 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

**---------------------------**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාහන අංගනයේ ගර්හිත වාහන 78 ක් පැවති අතර ඉන් වාහන 06 ක් වසර 05 කට වැඩි කාලයක් ද, 02 ක් වසර 04 කට වැඩි කාලයක් ද, 11 ක් වසර 03 කට වැඩි කාලයක්, ගර්හිත තත්ත්වයෙන් පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2016 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**--------------------------------------**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් ලබා දී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | | රු. | |
| මෝටර් වාහන 01 | ආරක්ෂක අමාත්‍යාංශය | 8,249,999 | 2011 සිට |
| මෝටර් වාහන 03 | ආරක්ෂක අමාත්‍යාංශය | 7,636,973 | 2015 සිට |
| මෝටර් වාහන 01 | ආරක්ෂක සේවා විද්‍යාලය | 3,477,402 | 2012 සිට |
| මෝටර් වාහන 01 | ආරක්ෂක සේවා විද්‍යාලය | 1,850,000 | 2015 සිට |
| මුහුදු ගිලන් යාත්‍රා 01 | උතුරු පළාත් ආණ්ඩුකාර කාර්යාලය | 28,572,353 | 2015 සිට |

**(ඇ)** **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වෙනත් ආයතන සතු පහත සඳහන් වත්කම් විධිමත් පරිදි පවරා නොගෙන සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (i) | ඉඩම් (අක්කර) | 182 | 588,730,600 |
| (ii) | ගොඩනැගිලි | 83 | 155,052,670 |
| | ගොඩනැගිලි | 174 | වටිනාකම තක්සේරු කර නැත. |
| (iii) | මෝටර් වාහන | 62 | 427,752,330 |
| | මෝටර් වාහන | 33 | වටිනාකම තක්සේරු කරනැත. |

## 3.9 අවිධිමත් ගනුදෙනු

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ)** **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 (අ) මාර්ගෝපදේශයට පටහැනිව ලබා ගෙන තිබුණු එක ලංසුවක් පමණක් පදනම් කරගෙන ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා රු.720,226 ක් වූ “බෙයාරින් හීටර්” (BEARING HEATER) මිලදී ගෙන තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත්, රු.2,867,130 ක් වටිනා Bronze Hollow Shaft මිලදී ගැනීමේදී සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11(ආ)(iii) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.2,204,991 ක් වූ කොන්ත්‍රාත්තුවේ වටිනාකම සඳහා කොන්ත්‍රාත්කරුගෙන් ලංසු සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.

**(ආ)** **අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අධිකාර බලය නොමැති ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(i) මිලදී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ ශ්‍රී ලංකා නාවික හමුදාවට ලැබීමට පෙර චෙක්පත් ලිවීම සහ සැපයුම්කරුවන්ට චෙක්පත් ලබාදීමේ පූර්ව ගෙවීම් ප්‍රේෂණපත් ක්‍රමය සම්පූර්ණයෙන් වැරදි ක්‍රමයක් බවත්, එම ගනුදෙනු ක්‍රමය නිවැරදි කරන ලෙස 2011 ජූනි 11 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී නියෝග ලබා දී තිබුණද ,එකී නියමයන්ට පටහැනිව 2011 ජූලි මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ එම ක්‍රමය උපයෝගී කර ගනිමින් අවස්ථා 8653 කදී රු.2,729,523,290 ක් වැය කර භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ii) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බාහිර පාර්ශවයන්ට සපයනු ලබන සේවාවන් අතරින් නාවික සුභසාධන ව්‍යාපෘති අරමුදල මගින් 2014 හා 2015 වර්ෂවලදී එකතුව රු.මිලියන 1,604 ක්ද, මාලිමා සත්කාරක සේවාව මගින් 2014 හා 2015 වර්ෂවලදී එකතුව රු.මිලියන 90 ක්ද හා ශ්‍රී ලංකා නාවික සුභසාධක අරමුදල මගින් 2014 වර්ෂයේදී රු.මිලියන 113 ක්ද රැස්කර තිබුණි. එම ආදායම්වලින් රු.මිලියන 710 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණි. ඒ අනුව ඉතිරි රු.මිලියන 1,097 ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.10 හඳුනාගත් පාඩු

--------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) නාවික හමුදාව සතු වටිනාකම රු.1,577,792 ක්වූ වාහන 03 ක් අස්ථානගතව තිබුණද, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනාගැනීමට නාවික හමුදාව අපොහොසත් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ බටහිර විධානයේ සිදු වී තිබුණු රු.300,000 ක් වටිනා භූමිතෙල් ලීටර් 6600 ක විෂමතාවය සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍යව තිබුණු ඉන්වොයිස් පතේ මුල් පිටපත අස්ථානගත වීම හේතුවෙන් එම පරීක්ෂණ කටයුතු නතර කර තිබුණි. එහි මුල් පිටපත ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබා ගෙන තිබුණත්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු 2016 අගෝස්තු මාසය වන විටත් එම පරීක්ෂණ කටයුතු නිම කර අදාළ වගකිව යුතු පුද්ගලයන් හඳුනාගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව අපොහොසත් වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ජී.අයි.හෙවිඩියුටි පයිප්ප මිලදී ගැනීමේදී පිරිවිතරයන්ට අනුව අවම මිලගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුගෙන් මිලදී ගැනීම සිදු නොකර, ඒ සඳහා පිළිගත හැකි සාධාරණ හේතු දැක්වීමකින් තොරව, ඊට වඩා ලංසුවක් ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් මිලදී ගැනීම හේතුවෙන් රු.84,672 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) මිලදී ගැනීමේ ක්‍රියාවලිය සඳහා අධික කාලයක් ගතවීම හේතුකොට ගෙන නාවික හමුදාවට “ඇන්කර් රෝඩ්” මිලදී ගැනීමේදී තුන්වරක් මිල ගණන් කැඳවීමට සිදුවී තිබුණි. එම කාලය තුළ භාණ්ඩයේ මිලගණන් ඉහළ යාම නිසා රු.781,340 ක් වැඩියෙන් ගෙවීමට සිදු වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ පරාක්‍රම නාවික ගබඩාව සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේදී ගිවිසුම්ගත සැපයුම්කරුවන්ගෙන් මිලදී නොගෙන (Rate Contract) සුළු මුදල් අග්‍රිමය මගින් මිලදී ගැනීම හේතුකොට ගෙන රු.71,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. මේ සඳහා පිළිතුරු වශයෙන් “ විවිධ හේතූන් මත ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුවන් මගින් ඒකාකාරී සැපයුම සිදුවී නොමැති

බැවින්, ලිපිද්‍රව්‍ය අවශ්‍යතාව පිරවීම සඳහා සුළු මුදල් අග්‍රිමය භාවිතා කර ඇති බව '' නාවික හමුදාපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි.

(ඊ) ටෙන්ඩර් මණ්ඩලය මඟින් සුදු කැකුළු සහල් සහ රතු කැකුළු සහල් සඳහා කිලෝග්‍රෑම් 1 ක් වෙනුවෙන් රු.58 ක මිලක් ගෙවීමට තීරණය කර තිබූ නමුත්, කිලෝග්‍රෑම් 1 ක් වෙනුවෙන් රු.60 බැගින් සැපයුම්කරුවන්ට ගෙවා තිබීම හේතුවෙන් සහල් කිලෝග්‍රෑම් 62,475 ක් නාවික හමුදාවට සැපයීම වෙනුවෙන් රු.124,950 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) 2009 මැයි 24 දින ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සමාගමක් වෙත අළුත්වැඩියාව සඳහා භාර දී තිබුණු ජීප් රථ 02 ක් අළුත්වැඩියා කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් දිරාපත් වීම නිසා සිදු අලාභය එම සමාගමෙන් අයකර ගැනීමට 2016 අගෝස්තු මාසය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.11 අනාර්ථික ගනුදෙනු

---------------------

නියැදි විගණන පරීක්ෂාවේදි අනාවරණය වූ ආර්ථික නොවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා නාවික නෞකා තම්බපණ්ණි ආයතනයට අයත් නිලබැම්ම නාවික අනුඛණ්ඩයේ විදුලි සැපයුම වෙනුවෙන් බිල්පත් නිරවුල් නොකිරිම නිසා 2013 දෙසැම්බර් 01 දින සිට විදුලි සැපයුම විසන්ධි කර තිබුණි. මෙම අනුඛණ්ඩයේ විදුලි බිල මසකට රු.20,000 කට ආසන්න ප්‍රමාණයක් වී තිබුණි. එම නාවික අනුඛණ්ඩයට විදුලි ජනක යන්ත්‍රය මඟින් දිනකට පැය 7 ක් පමණක් විදුලිය ලබා ගැනීමට මසකට රු.60,000 ක පමණ මුදලක් වැය කර තිබුණි. ඒ අනුව විදුලි ජනක යන්ත්‍රය සඳහා ඉන්ධන හා නඩත්තු වියදම් වශයෙන් එම කාලය තුළ රු.මිලියන 1.2 කට ආසන්න මුදලක් වැය කර තිබුණි. විදුලි සැපයුම විසන්ධි කර මාස 30 කට අධික කාලයක් ගතවී තිබුණත්, විදුලි සැපයුම නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** ශ්‍රී ලංකා නාවික හමුදාව 2015 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසයන්හි විදුලි බිල්පත් 20 ක් වෙනුවෙන් නියමිත දිනට මුදල් නොගෙවීම හේතුවෙන් මාසික විදුලි බිලට අමතරව රු.174,045 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. එසේම පසුගිය වර්ෂ 4 ක කාල සීමාව තුළ රු.මිලියන 29 කට අධික මුදලක් දඩපොලී වශයෙන් ගෙවා තිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාව සතු යාත්‍රා 636 ක් හා නෞකා 143 ක් අක්‍රියව පැවැතුණි. එම යාත්‍රා සහ නෞකාවලින් ඇ.ඩො.මිලියන 86 ක් ගෙවා මිලදි ගත් නෞකා සහ යාත්‍රා 39 ක්ද, රු.මිලියන 558 ක් ගෙවා මිලදී ගත් නෞකා හා යාත්‍රා 100 ක්ද වී තිබුණි. මෙම යාත්‍රා හා නෞකා අළුත්වැඩියා නොකිරීමෙන් දිරාපත් වීමේ අවධානමක් පැවැතියත්, ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා දී නොතිබුණි. එසේ අළුත්වැඩියා කිරිම මඟින් යාත්‍රා හා නෞකා යථා තත්ත්වයට පත් නොකර 2013 වර්ෂයේදි ඇ.ඩො.මිලියන 133.10 ක පිරිවැයට මුර යාත්‍රා දෙකක් ණය පදනම මත මිලදි ගැනීමට ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2016 අගෝස්තු මාසය වන විට ඒ සඳහා ඇ.ඩො.මිලියන 66.55 (රු.මිලියන 8,800) ක් ගෙවා තිබුණත්, 2016 අගෝස්තු මාසය අවසන් වන විටත් එම යාත්‍රා දෙක ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලැබී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ ධාරිතා වර්ධනය සඳහා (පුහුණු කිරීම්) වැය කර තිබුණු රු.මිලියන 710 ක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලැසුම් සහගතව හා ඵලදායිකව යොදා ගෙන නොතිබුණු විගණනයට ඉදිරිපත් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ පුහුණු අංශ මගින් සකස් කර තිබුණු බව වාර්ෂික කාර්යසාධන වාර්තාව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාව සතු වාහන 02 ක් අළුත්වැඩියා කිරීම සඳහා බාහිර ආයතනයක් වෙත භාර දී වසරකට අධික කාලයක් ගත වී තිබුණද, ඒවා අළුත්වැඩියා කටයුතු නිම කර නැවත නාවික හමුදාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) උතුරු මැද නාවික විධානයේ ඉංජිනේරු වැඩපලේ Turbo charges 22 ක් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමකින් තොරව රඳවා ගෙන තිබුණි. ඒ හේතුවෙන් මෙම Turbo charges භාවිතයට ගැනීමට නොහැකි වන තත්ත්වයට පත්වීමට ඉඩ ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) උතුරු මැද නාවික විධානයේ අමතර කොටස් බෙදාහැරීමේ මධ්‍යස්ථානය තුළ රු.973,318 ක් වටිනා අමතර කොටස් විෂයයන් 141 ක ප්‍රමාණයක් ඉතා දීර්ඝ කාලයක සිට නිකුත් නොවී පැවැතුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

**සිවිල් කාර්ය මණ්ඩලය**

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 04 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 145 | 66 | 79 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1768 | 1633 | 135 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 290 | 243 | 47 |
| | එකතුව | 2219 | 1951 | 268 |

**නිල ඇඳුම් කාර්යය මණ්ඩලය**

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නිලධාරීන් සහ නාවිකයන් | 51,423 | 53,056 | 4,885 | 6,518 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව කටයුතු කර නොතිබුණි.

(ආ) **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| නිලධාරීන් | 03 | මාධ්‍ය කේන්ද්‍රය,රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය. | 2005 වසරේ සිට |
| නාවිකයන් | 16 | | |
| නාවිකයන් | 05 | රණවිරු සේවා අධිකාරිය | 2009 වසරේ සිට |
| නිලධාරීන් | 02 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 2011 වසරේ සිට |
| නාවිකයන් | 01 | | |
| නිලධාරීන් | 05 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 2009 වසරේ සිට |
| නාවිකයන් | 02 | | |